# මුලටියන ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

------------------------------

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 24 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 29 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට මුලටියන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සමඟ එකී ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව්කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මිලට ගෙන තිබුණු රු.81,496 ක් වටිනාකම වූ ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.313,573 ක් වූ අතැති තොගයේ වටිනාකම වර්ගීකරණයකින් තොරව ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සභාව සතු ස්ථාවර තැන්පත් 02 කට අදාලව ලැබිය යුතු පොලී ආදායම රු.353,502 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු පොලී මුදල රු.900,196 ක් ලෙසට දක්වා ආදායම රු.546,694 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ රු.726,480 ක පොලී ආදායම, ආදායම් ලැබීමක් ලෙසට බැර නොකර ලැබිය යුතු මුදලක් ලෙසට ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ලේඛනය අනුව ලැබිය යුතු උසාවි දඩ මුදල රු.247,646 ක් වුවද උසාවි දඩ ලෙජරයට අනුව වටිනාකම රු.210,220 ක් වූයෙන් අඩුවෙන් දක්වා තිබූ මුදල රු.37,426 ක් විය.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,189,720 ක් වූ ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතු මුදලක් ලෙසට ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ ආදායම් යටතේ හිඟ හිටි බලපත්‍ර ගාස්තු ශේෂයක් නොතිබුණද විගණනයට ඉදිරිපත් කරන ලද ආදායම් අයකර ගැනීම් වාර්තාව අනුව රු.11,300 ක හිඟහිටි බලපත්‍ර ගාස්තු ශේෂයක් විය.

1.3.4 නොසැසඳූ පාලන ගිණුම

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 07 කට අදාල වටිනාකම රු.2,867,183 ක් වූ අතර ඉදිරිපත් කර තිබූ උපලේඛන අනුව වටිනාකම රු.3,533,011 ක් වූයෙන් වෙනස රු.665,828 ක් විය.

1.3.5 අවිනිශ්චිත ගිණුම

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වල දැක්වන රු.36,288 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට ගෙන එමින් පැවතුනි.

1.3.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.2,096,220 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.63,764,871 ක් විය.

1.3.7 නිරවුල් නොකළ ගිණුම්

රු.18,058 ක් වූ ගිණුම් ශේෂයන් 02 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.8 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.177,277,732 ක් වටිනා ගිණුම් විෂයයන් 09 ක් සම්බන්ධව සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

1.3.9 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 5(12) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 6 ඉක්මවූ රු.168,705 ක වටිනාකම වූ චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් රීති ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) රීති 217සහ 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා එසේ කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම  රු.7,225,252 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.3,464,683 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| අක්කර බදු | 49 | 75 | 141 |
| බලපත්‍ර ගාස්තු | 582 | 644 | 11 |
| වෙනත් ආදායම් | 22,945 | 23,961 | 106,068 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

පහත කරුණු නිරීක්ෂණය  කරනු ලැබේ..

(අ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අක්කර බදු හිඟහිටි මුදල රු.81,666 ක් වූ අතර වර්ෂය තුල බිල්කිරීම් රු.22,111 ක් විය.  සමාලෝචිත වර්ෂයේ බිල්කිරීම් වලින් රු.10,769 ක්ද ඉකුත් වර්ෂ වෙනුවෙන් රු.28,560 ක්ද අයවී තිබූ අතර අයවීමේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 48 ක් හා සියයට 35 ක් තරම් සුළු අගයක් ගෙන තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බලපත්‍ර ගාස්තු හිඟහිටි මුදල රු.11,800 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී අයවී තිබුනේ රු.500 ක් පමණක් වූයෙන් අයවීමේ ප්‍රගතිය සියයට 4 ක් තරම් සුළු අගයක් විය.

#### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.144,840 කි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

3.1.1 වීථි පහන් නඩත්තුව හා පාලනය

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අනුමත වීථි පහන් සංඛ්‍යාව 54 ක් වූ අතර බල ප්‍රදේශයේ සවිකර තිබූ පහන් කණු 376 ක් වෙනුවෙන් 2013 වර්ෂයේදී උපකරණ සඳහා රු.106,273 ක්ද වැටුප් සඳහා රු.251,826 ක්ද වශයෙන් එකතුව රු.358,101 ක් වැයකර තිබුණි.

පළාත් සභා බල ප්‍රදේශය තුල වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 07 දිනැති අංක පීඊ/01/01 දරන චක්‍රලේඛය පරිදි වීථි ලාම්පු ස්ථාපනය කිරීමේදී බල ප්‍රදේශයේ වාර්ෂික ගෘහස්ථ හා පොදු කාර්යය සිල්ලර විදුලි බල පාරිභෝජනයෙන් සියයට 3 ප්‍රමාණයක් නොඉක්ම විය යුතු බව දක්වා ඇතත් එකී කාරණය සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමුව නොතිබුණි.

3.1.2 අනවසර ඉදිකිරීම්

සභා බල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් 11 ක් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(Viii) හි (ඉ)(උ) සහ 126 (ix) හි සඳහන් අතුරු ව්‍යවස්ථාවලට අනුව කටයුතු කර නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය අනුව සභාවේ සුභ සාධනය සඳහා හෝ සභා නිලධාරීන්ට යම් ආපදාවක් ඇති වූ විට ඔවුන්ට සහන සැලසීම සඳහා පිහිටුවාගත් සංස්ථාපනය කරන ලද අරමුදලකට සභාව විසින් තීරණය කරන ලද යම් මුදලක් ලබාදිය හැකි වුවද එම වගන්තියට පටහැනිව අධ්‍යාපන චාරිකාවක් යාම සඳහා රු.119,000 ක මුදලක් ගෙවා තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 02 | 01 | 01 | |
| ද්විතියික | 25 | 25 | | |
| ප්‍රාථමික | 28 | 23 | 05 | |
| (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 8 | | 08 |
| | 55 | 57 | 06 | 08 |

(i) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා රු.11,024,900 ක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂය තුල වැටුප් හා දීමනා ලෙස

රු.14,012,142 ක මුදලක් වැයකර තිබුණෙන් සහා අරමුදලට රු.2,987,242 ක අතිරේක වැය බරක් වී තිබුණි.

(ii) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 පරිදි සහ මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 පරිදි පළාත් පාලන ආයතනවල තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ වෙනයම් පදනමක් මත කරනු ලබන බඳවා ගැනීම් වහාම අත්හිටවිය යුතු බව දක්වා තිබුණද ප්‍රාදේශීය සභාව 2013 වර්ෂයේදී සේවකයින් 08 දෙනෙකු බඳවාගෙන රු.1,899,201 ක මුදලක් ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
---------------------------------------

4.1 විගණන හා කළමනාකරණ කමිටු
------------------------------------

සභාව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය
------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛනය සඵල මූල්‍ය පාලන කාරකයක් ලෙසට යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
-----------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය